# නාට්‍ය හා රංගකලාව පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව

## 2025/26 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීම



**1.** යුනෙස්කෝ සංවිධානයට අනුබද්ධ, ජාත්‍යන්තර රංගකලා ආයතනයේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත, ටවර් හෝල් රඟහල පදනම විසින් පවත්වාගෙන යනු ලබන නාට්‍ය හා රංගකලා (දෙවර්ෂ පූර්ණකාලීන) උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ අධ්‍යයන වර්ෂ 2025/26 සඳහා නවක සිසුන් බඳවා ගනු ලැබේ.

මෙම දෙවර්ෂ පූර්ණ කාලීන උසස් ඩිප්ලෝමා පාඨමාලාව ( SLQF 3 හා 4 ) සාර්ථකව සම්පූර්ණ කර අවශ්‍ය GPA අගය සපුරාලන සිසුන් ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනවේදී ( නාට්‍ය හා රංගකලා ) උපාධිය ( SLQF 5 හා 6 ) සඳහා යොමු කරනු ලැබේ.

**2.** සුදුසුකම්

(අ) සිංහල හා සෞන්දර්ය විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයන් හා ගණිතය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සහිතව සම්මාන 03 ක් ඇතුළුව විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබීම.

(ආ) අ. පො. ස. උසස් පෙළ විභාගය ඕනෑම විෂය ධාරාවකින් සමත් වී තිබීම.

(ඇ) සියලු අයදුම්කරුවන් 2025.04.11 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 25 ට නොවැඩි අය විය යුතු ය.

**3.** බඳවාගැනීමේ ක්‍රමවේදය

ඉහත අවම මූලික සුදුසුකම් සපුරා ඇති සියලු අයදුම්කරුවන්, නාට්‍ය හා රංගකලාව ආශ්‍රිත සාමාන්‍ය දැනීම පරීක්ෂා කෙරෙන පැයක ලිඛිත පරීක්ෂණයකට හා සිංහල භාෂා භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන පැයක ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. එයින් අවශ්‍ය අවම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් සියලුදෙනා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවන අතර, එම පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් **60** දෙනා පාඨමාලාව සඳහා බඳවාගනු ලැබේ.

**4.** සම්පූර්ණ පාඨමාලා ගාස්තුව

වසර 02 සඳහාම සම්පූර්ණ පාඨමාලා ගාස්තුව රු. 200,000.00 කි. එය එක් වරම හෝ වාරික 04 කින් (රු. 75,000.00/ රු. 45,000.00/ රු. 40,000.00 සහ රු 40,000.00 ලෙස ) ගෙවිය හැක.

**5.** අයදුම්පත් යොමුකිරීමේ සිට බඳවා ගැනීම් අවසානය දක්වා වන සියළු දැනුවත් කිරීම් WHATSAPP සමූයක් හරහා සිදුකරනු ලබන බැවින් වෙනස් නොවන WHATSAPP අංකයක් සහ අතිරේක දුරකථන අංකයක් අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතු ය.

ටවර් හෝල් රඟහල පදනමේ වෙබ් අඩවියේ ( www.towerhall.lk/si) සඳහන් සබැඳිය ( Link ) භාවිතයෙන් අයදුම්පත ඇතුළත් Google පෝරමය නිසිලෙස සම්පූර්ණ කර අයදුම්පත් ගාස්තුව වන රු. 2,000.00 ක මුදල ලංකා බැංකුවේ හයිඩ්පාර්ක් ශාඛාවේ ටවර් හෝල් රඟහල පදනම නමින් ඇති අංක 2327541 ගිණුමට බැරකර එහි පිටපතක් Google පෝරමයේ නියමිත ස්ථානයට උඩුගත කර අයදුම්පත යොමු කිරීමට කටයුතු කළ යුතු ය. ලදුපත නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් යොමුකිරීමට සපයා ඇති Google පහසුකම 2025 අප්‍රේල් මස 11 දින ප.ව. 4.00 අවසන් වනු ඇත. මීට අදාළ වැඩි විස්තර 075 1407094 මගින් උපාලි හෝ 070 1243673 මගින් ලක්මිණී ඇමතීමෙන් ලබාගත හැකිය.

අධ්‍යක්ෂ ජනරාල්,
ටවර් හෝල් රඟහල පදනම,
සව්සිරිපාය
අංක **123**, විජේරාම මාවත, කොළඹ **07**.

ටවර් හෝල් රඟහල පදනම
බුද්ධශාසන, ආගමික සහ
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.